ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධන බලකාය
பொருளாதாரப் புத்தெழுச்சி மற்றும் வறுமை ஒழிப்புக்கான ஜனாதிபதி செயலணி
**Presidential Task Force for Economic Revival and Poverty Alleviation**

මගේ අංකය : PTF/01/BIP Meetings/01
දිනය : 2021.03.17

සියලුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්,
ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්,
කැබිනට් අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත

**"ගම සමඟ පිළිසඳරක් තුළින් වැඩ සමඟ යළි ගමට - 2021 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම"**
**ජාතික සම්බන්ධීකරණ අනුකමිටු හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ අනුකමිටු රැස්වීම්**

නව සංවර්ධන ප්‍රවේශයක් සඳහා එළඹෙමින්, ග්‍රාමීය ආර්ථික සහ ජාතික ආර්ථික සංවර්ධන ඉලක්ක කඩිනමින් ලඟා කරගැනීමේ අරමුණින් කැබිනට් හා රාජ්‍ය අමාත්‍යවරුන්ගෙන් සැඳුම්ලත් ජාතික සම්බන්ධීකරණ අනුකමිටු ස්ථාපිත කරන ලදී. එලෙසම, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්ගේ මූලිකත්වයෙන් සහ ප්‍රාදේශීය රාජ්‍ය නිලධාරීන්ගෙන් සමන්විතව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව යටතේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ අනුකමිටු පිහිටුවා ඇත.

02. ග්‍රාම සේවා වසම් මට්ටමින් පිහිටුවා ඇති ග්‍රාමීය කමිටු විසින් හඳුනාගෙන ඇති ග්‍රාමීය සංවර්ධන යෝජනා ප්‍රමුඛතාවය අනුව ලේඛණගත කොට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව විසින් අනුමත කර ඔබ අමාත්‍යාංශය යටතට වැටෙන සංවර්ධන ප්‍රමුඛතා ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් අමාත්‍යාංශ වෙත එවා ඇත. දැනට තොරතුරු පද්ධතියට ඇතුළත් කර ඇති එම සංවර්ධන ප්‍රමුඛතා කාර්යසාධන බලකාය විසින් ද අමාත්‍යාංශ වෙත ලබාදීමට අපේක්ෂා කරමි. ඔබ අමාත්‍යාංශ විසින් එම සංවර්ධන ප්‍රමුඛතා අධ්‍යයනය කර, අනුමත කළ ග්‍රාමීය සංවර්ධන ප්‍රමුඛතා, 2021-2023 මධ්‍යකාලීන සංවර්ධන සැලසුම් තුළට කඩිනම් ඇතුළත් කර අදාළ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලට දැනුම් දීමට පියවර ගන්නා ලෙස කාරුණිකව ඉල්ලමි. තවද, ප්‍රාදේශීය සංවර්ධන ප්‍රමුඛතා ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ගැටලු විසඳා ගැනීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලට හා ජාතික සම්බන්ධීකරණ අනුකමිටු වෙත සෘජුව පැමිණ කරුණු ඉදිරිපත් කිරීමට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්ට අවස්ථාව සලසා දී ඇත.

03. සියලුම කැබිනට් හා රාජ්‍ය අමාත්‍යාංශ යටතේ ඇති දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල හා ව්‍යවස්ථාපිත ආයතනවල ප්‍රධානීන් තම ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන් ප්‍රාදේශීය සංවර්ධන අනුකමිටු රැස්වීම් වලට අවශ්‍යතාවය පරිදි සහභාගීකර වීමට කටයුතුකිරීම අවශ්‍ය වේ. ඒ තුළින් තම ආයතන හරහා ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හා සංවර්ධන අවශ්‍යතා ලේඛන යාවත්කාලීන කර ගැනීමට පහසුව හා මාර්ගය සැලසේ. ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන්ගේ කාර්යසාධනය මැනීමේදී නිර්ණායක ලෙස තම ආයතනයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා දක්වා ඇති දායකත්වය හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ අනුකමිටු රැස්වීම්වලට සහභාගීත්වය සලකා බැලීම කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත්ය.

අරලියගහ මන්දිර පරිශ්‍රය, කොළඹ 03 | அலரி மாளிகை வளாகம், கொழும்பு 03 | Temple Trees Premises, Colombo 03
Phone: 0112354854, 0117481524 | Fax: 0112473839, 0112333066 | Email: ptf.erpa@gmail.com

04. කැබිනට් හා රාජ්‍ය අමාත්‍යාංශ යටතේ ඇති දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල හා ව්‍යවස්ථාපිත ආයතනවල ප්‍රධානීන් ජාතික සම්බන්ධීකරණ අනුකමිටු රැස්වීම් වලට කමිටු සභාපතිවරුන්ගෙන් උපදෙස් පරිදි, අවශ්‍යතාවය අනුව, අනුකමිටු ලේකම්වරුන් විසින් කැඳවිය හැකිය. තවද, එම ආයතන ප්‍රධානීන්ට අවශ්‍ය අවස්ථාවලදී තම ක්ෂේත්‍රයට අදාළ ගැටලු විසඳාගැනීම සඳහා එම ජාතික සම්බන්ධීකරණ අනුකමිටු රැස්වීම්වලට සහභාගී විය හැකිය.

05. ජාතික සම්බන්ධීකරණ අනුකමිටු විසින් 2021 වර්ෂය සඳහා රැස්වීම් දින දර්ශනය සකස් කර ඇත. එය ඔබගේ දැන ගැනීම සඳහා මේ සමඟ එවමි. එලෙසම, එක් එක් ප්‍රාදේශීය සම්බන්ධීකරණ අනුකමිටු රැස්වීම් සඳහා වාර්ෂික රැස්වීම් දින දර්ශනය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්ගේ මූලිකත්වයෙන් සකස් කර ප්‍රාදේශීය ආයතන ප්‍රධානීන්ට ලබාදීම තුළින් වඩාත් සාර්ථක හා සැලසුම් සහගත ලෙස ප්‍රාදේශීය සංවර්ධන කටයුතු මෙහෙයවිය හැකිය.

රාජ්‍ය ව්‍යුහය තුළ වූ ආයතන වෙන වෙනම සකස් කර ක්‍රියාත්මක කරන සංවර්ධන සැලසුම් ප්‍රධාන ක්ෂේත්‍ර පහක් (5) ඔස්සේ ඒකාබද්ධ කර නව සංවර්ධන ප්‍රවේශයක් තුළින් ප්‍රතිඵල ළඟා කර ගැනීම සඳහා රජය විසින් දරණ ප්‍රයත්නයට මෙහිදී ඔබ දක්වන දායකත්වය හා කැපවීම බෙහෙවින් අගය කරමි.

**ඇන්ටන් පෙරේරා**

අග්‍රාමාත්‍ය අතිරේක ලේකම්
සම ලේකම් - ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන
ජනාධිපති කාර්යසාධන බලකාය

පිටපත් :

1. ජාතික සම්බන්ධීකරණ අනුකමිටු ලේකම්වරුන්
2. දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන්
3. ප්‍රාදේශීය ලේකම්වරුන්

} කාරුණික දැනගැනීම සඳහා

2021 - අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම
"ගම සමඟ පිළිසඳරක් - වැඩ සමඟ යළි ගමට"

ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධන බලකාය

## ජාතික සම්බන්ධීකරණ අනු කමිටු රැස්වීම් - වාර්ෂික දින දර්ශනය 2021

| # | අනුකමිටුව | පෙබරවාරි | මාර්තු | අප්‍රියෙල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝම්බර් | නොවැම්බර් | දෙසැම්බර් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | කෘෂිකාර්මික අනුකමිටුව @ නිල මැදුර | **18** බ්‍රහස්පතින්දා ප.ව.5.00 | **10** බදාදා ප.ව.2.00 | **22** බ්‍රහස්පතින්දා ප.ව.2.00 | **13** බ්‍රහස්පතින්දා ප.ව.2.00 | **17** බ්‍රහස්පතින්දා ප.ව.2.00 | **15** බ්‍රහස්පතින්දා ප.ව.2.00 | **12** බ්‍රහස්පතින්දා ප.ව.2.00 | **16** බ්‍රහස්පතින්දා ප.ව.2.00 | **14** බ්‍රහස්පතින්දා ප.ව.2.00 | **18** බ්‍රහස්පතින්දා ප.ව.2.00 | **16** බ්‍රහස්පතින්දා ප.ව.2.00 |
| 2. | ජීවනෝපාය අනුකමිටුව @ නිල මැදුර | **17** බදාදා ප.ව.2.00 | **17** බදාදා ප.ව.2.00 | **21** බදාදා ප.ව.2.00 | **12** බදාදා ප.ව.2.00 | **09** බදාදා ප.ව.2.00 | **14** බදාදා ප.ව.2.00 | **11** බදාදා ප.ව.2.00 | **08** බදාදා ප.ව.2.00 | **13** බදාදා ප.ව.2.00 | **10** බදාදා ප.ව.2.00 | **08** බදාදා ප.ව.2.00 |
| 3. | යටිතල පහසුකම් අනුකමිටුව @ මහ නැගුම මහ මැදුර | **17** බදාදා ප.ව.2.30 | **17** බදාදා ප.ව.2.30 | **28** බදාදා ප.ව.2.30 | **25** අඟහරුවාදා ප.ව.2.30 | **16** බදාදා ප.ව.2.30 | **28** බදාදා ප.ව.2.30 | **25** බදාදා ප.ව.2.30 | **15** බදාදා ප.ව.2.30 | **27** බදාදා ප.ව.2.30 | **17** බදාදා ප.ව.2.30 | **15** බදාදා ප.ව.2.30 |
| 4. | සමාජ යටිතල පහසුකම් අනුකමිටුව @ අධ්‍යාපන අමාත්‍යාංශය | - | **03** බදාදා පෙ.ව. 11.30 | **06** අඟහරුවාදා පෙ.ව. 11.15 | **04** අඟහරුවාදා පෙ.ව.11.15 | **01** අඟහරුවාදා පෙ.ව.11.15 | **06** අඟහරුවාදා පෙ.ව.11.15 | **03** අඟහරුවාදා පෙ.ව.11.15 | **07** අඟහරුවාදා පෙ.ව.11.15 | **05** අඟහරුවාදා පෙ.ව.11.15 | **02** අඟහරුවාදා පෙ.ව.11.15 | **07** අඟහරුවාදා පෙ.ව.11.15 |
| 5. | මහජන ආරක්ෂාව හා සමාජ සංවර්ධන අනුකමිටුව@ SLIDA සංකතනී ශාලාව | **25** බ්‍රහස්පතින්දා ප.ව.2.30 | **12** සිකුරාදා ප.ව.2.30 | **09** සිකුරාදා ප.ව.2.30 | **07** සිකුරාදා ප.ව.2.30 | **11** සිකුරාදා ප.ව.2.30 | **09** සිකුරාදා ප.ව.2.30 | **06** සිකුරාදා ප.ව.2.30 | **10** සිකුරාදා ප.ව.2.30 | **08** සිකුරාදා ප.ව.2.30 | **12** සිකුරාදා ප.ව.2.30 | **10** සිකුරාදා ප.ව.2.30 |